# ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව
## තෙල් පිරිපහදුව
## පුහුණුවන තෙල් පිරිපහදු කාර්මික ශිල්පී

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට අයත් සපුගස්කන්ද තෙල් පිරිපහදුවේ විවිධ කාර්මික ශ්‍රේණිවල වෘත්තීමය පුහුණුව සඳහා වසර 04 ක පුහුණුවීමේ පාඨමාලාවක් ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.

පුහුණුවීමේ කටයුතු තෙල් පිරිපහදුවේ පුහුණු කිරීම් අංශය හා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය මගින් මෙහෙයවනු ලබන අතර, එය සිව් වසරක පාඨමාලාවක් ලෙස ක්‍රියාත්මක වනු ඇත.

මෙම පුහුණුව සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරන ශ්‍රී ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.
**(මෙම වෘත්තියේ ඇති කාර්යය ස්වභාවය අනුව පිරිමි අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛත්වය දෙනු ලැබේ. )**

(අ) අ.පො.ස.(සාපෙළ) විභාගයෙන් එක් වරකදී සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව විෂයයන්ට සම්මාන සහිතව විෂයයන් 06 කට නොඅඩු සාමාර්ථය

සමඟ,

අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් විද්‍යා විෂයයන් දෙකකින් (02) සමත් වී තිබිය යුතු අතර, එම විෂයයන් දෙකෙන් (02) එක් විෂයයක් පහත සඳහන් විෂයයන්ගෙන් විය යුතුය.

- රසායන විද්‍යාව
- භෞතික විද්‍යාව
- විද්‍යා හා තාක්ෂණවේදය
- ඉංජිනේරු තාක්ෂණවේදය

(ආ) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මනා ප්‍රවීණත්වයක් තිබිය යුතුය.

(ඇ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 24 නොඉක්ම විය යුතුය.

(ඈ) මනා සෞඛ්‍යය තත්ත්වයෙන් හෙබි යොවුන් පිරිමි අයදුම්කරුවන්ට ප්‍රමුඛත්වය හිමිවේ.

(ඉ) ලිඛිත පරීක්ෂණයකින් සමත් විය යුතුය.

පුහුණු කාලය වසර 04 ක් වන අතර, 80% කට වඩා පැමිණීම මත පහත සඳහන් පරිදි දීමනාවන් හිමිවේ. එයට අමතරව අදාළ අවස්ථාවලදී ආහාර සහ සේවා මුර දීමනාවක් හිමිවේ.

| **වසර** | **මාසික දීමනාව** |
|---|---|
| පළමු වසර | රු.14,000.00 |
| දෙවන වසර | රු.16,000.00 |
| තෙවන වසර | රු.20,000.00 |
| හතරවන වසර | රු.24,000.00 |

<u>සැලකිය යුතුයි</u>

- ❖ පුහුණුවීමේ කාලය තුලදී ඕනෑම කාලගුණික තත්ත්වයක් යටතේ සමහර අංශයන් තුල සේවා මුර රාජකාරි ක්‍රමය අනුව සේවයේ යෙදීමට හැකි විය යුතුයි.

- ❖ පුහුණුවීම් කාලසීමාව අවසානයේ පුහුණුව ලැබූ සියලුම ආධුනික පුහුණුලාභීන් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට බඳවා ගැනීමට සංස්ථාව බැඳී නොසිටින අතර, සිව් වසරක කාලසීමාව අවසානයේ පවතින පුරප්පාඩු අනුව ආයතනයේ අභිමතය පරිදි අදාළ අනුමැතීන් ලබා ගැනීමෙන් පසු වෘත්තීය හා සම්මුඛ පරීක්ෂණයක් පවත්වා එහි ප්‍රතිඵල මත බඳවා ගැනීමට සළකා බලනු ඇත.

- ❖ **මේ සම්බන්ධයෙන් මීට ප්‍රථම 2019.06.27 දින නිකුත් කරන ලද බාහිර ඇබෑර්තු නිවේදනය මින් අවලංගු කෙරේ.**

<u>අයදුම්කිරීමේ පිළිවෙල.</u>

සංස්ථා වෙබ් අඩවියේ (www.ceypetco.gov.lk ) පළ කර ඇති පොදු අයදුම්පත්‍රයේ ආකෘතියට අනුව ඔබගේ අයදුම්පත්‍රය යොමු කළ යුතුවේ. එමෙන්ම අධ්‍යාපන සහතිකවල පිටපත් ග්‍රාම නිලධාරී හෝ සාමදාන විනිශ්චයකාරවරයෙකු විසින් මුල් පිටපත සමඟ සසඳා සත්‍ය පිටපත් බවට සහතික කොට අමුණා එවිය යුතුය.

අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ තනතුරු නාමය සඳහන් කර, 2021.03.22 දිනට හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

ඉහතින් සඳහන් කර ඇති ආකාරයට පරිබාහිරව යොමු කරන ලද අයදුම්පත් පරීක්ෂා කිරීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**කළමනාකාර අධ්‍යක්ෂ**
ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව.
අංක.609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09.

2021 මාර්තු මස 01
යු/එස්